# ඇගයීම් වාර්තාව

## අ.පො.ස (සා.පෙළ) විභාගය - 2010

# 16 - ඉස්ලාම්

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2010

## ඇගයීම් වාර්තාව

# 16 - ඉස්ලාම්

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**ඉස්ලාම්**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2010

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහාය. ජාතික මට්ටමින් පවත්වන මෙම විභාගයේ ප්‍රතිඵල මත ලබාගන්නා සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික මෙන් ම ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස ප්‍රයෝජනවත් මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එකසේ ප්‍රයෝජනවත්වනු නොඅනුමාන ය. මේ නිසා මෙය වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙහි I කොටසෙහි ඇතුළත් වේ. II වන කොටසෙහි පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනාවලින් සමන්විත වේ.

III වන කොටසෙහි, පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු හා ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව ඔබට මෙයින් යම් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මකබව වැඩි දියුණුව සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලා සිටිමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ එම කාර්ය මණ්ඩලයටත්, මෙය මැනවින් මුද්‍රණය කර දුන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලාධිපතිතුමා ඇතුලු එම කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2012 ජනවාරි 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | **ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර මයා**<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | **ගයාත්‍රි අබේගුණසේකර මිය**<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | **මනෝමි සෙනෙවිරත්න මිය**<br>සහකාර විභාග කොමසාරිස්<br><br>**ජීවරාණි පුනිදා මිය**<br>සහකාර විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | **එම්.ටී. ඉක්බාල් මයා**<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ගුරු උපදේශක<br>කොළඹ<br><br>**අසීමා හුසෙන් මිය**<br>ගුරු සේවය<br>කයිරියා මුස්ලිම් බාලිකා ම.වි.<br>කොළඹ<br><br>**එම්.එච්.එස්. සිර්රියා**<br>ගුරු සේවය<br>ගම්පොළ සාහිරා විදුහල<br>ගම්පොළ |
| **පරිගණක පිටපත සැකසුම** | : | **රහීනා හාෂිම් මෙනවිය**<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10


## II කොටස


2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 11
2.1.2. I ප්‍රශ්න පත්‍රය 12
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 16

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ - ව්‍යුහය 17
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන 18


## III කොටස


3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 30

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 31

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

| |
|---|
| ඉස්ලාමීය හරවත්ව ඉගෙනීම තුළින් එහි දේශනයන් නිසිලෙස හඳුනාගෙන තම ජීවිතය අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා සකසාගන්නා අතර, විනය ගරුකව සාර ධර්ම සපිරි අන්‍ය ආගම්වලට ගරු කිරීමේ යහගුණය ඇති යහපත් විනයකින් යුතු සමාජයක් ලෙස ජීවත් වීමය. |

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 3402 | 82 | 3484 |
| දෙමළ | 21618 | 4854 | 26472 |
| ඉංග්‍රීසි | 37 | 1356 | 1393 |
| **එකතුව** | **25057** | **6292** | **31349** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 8877 | 35.43 | 1556 | 24.73 | 10433 | 33.28 |
| B | 4496 | 17.94 | 1130 | 17.96 | 5626 | 17.94 |
| C | 5494 | 21.93 | 1610 | 25.59 | 7104 | 22.66 |
| S | 4099 | 16.36 | 1364 | 21.68 | 5463 | 17.43 |
| W | 2091 | 8.34 | 632 | 10.04 | 2723 | 8.69 |
| **එකතුව** | **25057** | **100.00** | **6292** | **100.00** | **31349** | **100.00** |

වගුව 2

### 1.2.3. පළමු වතාවට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2362 | 738 | 31.24 | 377 | 15.96 | 525 | 22.23 | 414 | 17.53 | 2054 | 86.96 | 308 | 13.04 |
| 2. ගම්පහ | 1176 | 488 | 41.50 | 194 | 16.50 | 232 | 19.73 | 182 | 15.48 | 1096 | 93.20 | 80 | 6.80 |
| 3. කළුතර | 1312 | 521 | 39.71 | 206 | 15.70 | 224 | 17.07 | 222 | 16.92 | 1173 | 89.41 | 139 | 10.59 |
| 4. මහනුවර | 2987 | 1095 | 36.66 | 503 | 16.84 | 595 | 19.92 | 470 | 15.73 | 2663 | 89.15 | 324 | 10.85 |
| 5. මාතලේ | 654 | 263 | 40.21 | 107 | 16.36 | 139 | 21.25 | 88 | 13.46 | 597 | 91.28 | 57 | 8.72 |
| 6. නුවරඑළිය | 275 | 96 | 34.91 | 48 | 17.45 | 59 | 21.45 | 44 | 16.00 | 247 | 89.82 | 28 | 10.18 |
| 7. ගාල්ල | 531 | 196 | 36.91 | 78 | 14.69 | 108 | 20.34 | 81 | 15.25 | 463 | 87.19 | 68 | 12.81 |
| 8. මාතර | 364 | 175 | 48.08 | 48 | 13.19 | 56 | 15.38 | 50 | 13.74 | 329 | 90.38 | 35 | 9.62 |
| 9. හම්බන්තොට | 138 | 52 | 37.68 | 30 | 21.74 | 23 | 16.67 | 14 | 10.14 | 119 | 86.23 | 19 | 13.77 |
| 10. යාපනය | 16 | 1 | 6.25 | 4 | 25.00 | 2 | 12.50 | 4 | 25.00 | 11 | 68.75 | 5 | 31.25 |
| 11. කිලිනොච්චි | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 |
| 12. මන්නාරම | 134 | 40 | 29.85 | 19 | 14.18 | 25 | 18.66 | 35 | 26.12 | 119 | 88.81 | 15 | 11.19 |
| 13. වව්නියාව | 156 | 36 | 23.08 | 26 | 16.67 | 36 | 23.08 | 47 | 30.13 | 145 | 92.95 | 11 | 7.05 |
| 14. මුලතිව් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 15. මඩකලපුව | 1381 | 674 | 48.81 | 281 | 20.35 | 271 | 19.62 | 118 | 8.54 | 1344 | 97.32 | 37 | 2.68 |
| 16. අම්පාර | 3251 | 1369 | 42.11 | 587 | 18.06 | 712 | 21.90 | 451 | 13.87 | 3119 | 95.94 | 132 | 4.06 |
| 17. ත්‍රිකුණාමලය | 2132 | 618 | 28.99 | 378 | 17.73 | 515 | 24.16 | 415 | 19.47 | 1926 | 90.34 | 206 | 9.66 |
| 18. කුරුණෑගල | 1653 | 595 | 36.00 | 312 | 18.87 | 308 | 18.63 | 302 | 18.27 | 1517 | 91.77 | 136 | 8.23 |
| 19. පුත්තලම | 1779 | 568 | 31.93 | 347 | 19.51 | 428 | 24.06 | 310 | 17.43 | 1653 | 92.92 | 126 | 7.08 |
| 20. අනුරාධපුරය | 789 | 259 | 32.83 | 148 | 18.76 | 175 | 22.18 | 149 | 18.88 | 731 | 92.65 | 58 | 7.35 |
| 21. පොළොන්නරුව | 227 | 88 | 38.77 | 47 | 20.70 | 59 | 25.99 | 29 | 12.78 | 223 | 98.24 | 4 | 1.76 |
| 22. බදුල්ල | 594 | 179 | 30.13 | 119 | 20.03 | 147 | 24.75 | 93 | 15.66 | 538 | 90.57 | 56 | 9.43 |
| 23. මොනරාගල | 96 | 25 | 26.04 | 19 | 19.79 | 27 | 28.13 | 11 | 11.46 | 82 | 85.42 | 14 | 14.58 |
| 24. රත්නපුරය | 231 | 62 | 26.84 | 43 | 18.61 | 59 | 25.54 | 42 | 18.18 | 206 | 89.18 | 25 | 10.82 |
| 25. කෑගල්ල | 1033 | 444 | 42.98 | 186 | 18.01 | 187 | 18.10 | 133 | 12.88 | 950 | 91.97 | 83 | 8.03 |
| **සමස්ත දිවයින** | **23272** | **8582** | **36.88** | **4107** | **17.65** | **4912** | **21.11** | **3704** | **15.92** | **21305** | **91.55** | **1967** | **8.45** |

වගුව 3

## 1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2150 | 685 | 31.86 | 340 | 15.81 | 482 | 22.42 | 372 | 17.30 | 1879 | 87.40 | 271 | 12.60 |
| 2. හෝමාගම | 6 | 1 | 16.67 | 2 | 33.33 | 1 | 16.67 | 2 | 33.33 | 6 | 100.00 | 0 | 0.00 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 85 | 17 | 20.00 | 9 | 10.59 | 20 | 23.53 | 19 | 22.35 | 65 | 76.47 | 20 | 23.53 |
| 4. පිළියන්දල | 121 | 35 | 28.93 | 26 | 21.49 | 22 | 18.18 | 21 | 17.36 | 104 | 85.95 | 17 | 8.33 |
| 5. ගම්පහ | 324 | 147 | 45.37 | 41 | 12.65 | 60 | 18.52 | 49 | 15.12 | 297 | 91.67 | 27 | 8.33 |
| 6 මිනුවන්ගොඩ | 240 | 142 | 59.17 | 33 | 13.75 | 26 | 10.83 | 34 | 14.17 | 235 | 97.92 | 5 | 2.08 |
| 7. මීගමුව | 267 | 94 | 35.21 | 46 | 17.23 | 52 | 19.48 | 52 | 19.48 | 244 | 91.39 | 23 | 8.61 |
| 8. කැලණිය | 345 | 105 | 30.43 | 74 | 21.45 | 94 | 27.25 | 47 | 13.62 | 320 | 92.75 | 25 | 7.25 |
| 9. කළුතර | 1137 | 464 | 40.81 | 183 | 16.09 | 198 | 17.41 | 187 | 16.45 | 1032 | 90.77 | 105 | 9.23 |
| 10. මතුගම | 38 | 10 | 26.32 | 6 | 15.79 | 7 | 18.42 | 8 | 21.05 | 31 | 81.58 | 7 | 18.42 |
| 11. හොරණ | 137 | 47 | 34.10 | 17 | 12.41 | 19 | 13.87 | 27 | 19.71 | 110 | 80.29 | 27 | 19.71 |
| 12. මහනුවර | 627 | 257 | 70.99 | 104 | 16.59 | 117 | 18.66 | 98 | 15.63 | 576 | 91.87 | 51 | 8.13 |
| 13. දෙනුවර | 496 | 211 | 42.54 | 79 | 15.93 | 116 | 23.39 | 56 | 11.29 | 462 | 93.15 | 34 | 6.85 |
| 14. ගම්පොල | 536 | 162 | 30.22 | 92 | 17.16 | 112 | 20.90 | 108 | 20.15 | 474 | 88.43 | 62 | 11.57 |
| 15. තෙල්දෙණිය | 30 | 7 | 23.33 | 2 | 6.67 | 7 | 23.33 | 9 | 30.00 | 25 | 83.33 | 5 | 16.67 |
| 16. වත්තේගම | 436 | 139 | 31.88 | 70 | 16.06 | 77 | 17.66 | 86 | 19.72 | 372 | 85.32 | 64 | 14.68 |
| 17. කටුගස්තොට | 862 | 319 | 37.01 | 156 | 18.10 | 166 | 19.26 | 113 | 13.11 | 754 | 87.47 | 108 | 12.53 |
| 18. මාතලේ | 502 | 216 | 43.03 | 70 | 13.94 | 104 | 20.72 | 72 | 14.34 | 462 | 92.03 | 40 | 7.97 |
| 19. ගලේවෙල | 148 | 47 | 31.76 | 35 | 23.65 | 34 | 22.97 | 15 | 10.14 | 131 | 88.51 | 17 | 11.49 |
| 20. නාඋල | 4 | 0 | 0.00 | 2 | 50.00 | 1 | 25.00 | 1 | 25.00 | 4 | 100.00 | 0 | 0.00 |
| 21. විල්ගමුව | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 22. නුවරඑළිය | 48 | 4 | 8.33 | 8 | 16.67 | 9 | 18.75 | 15 | 31.25 | 36 | 75.00 | 12 | 25.00 |
| 23. කොත්මලේ | 130 | 57 | 43.85 | 24 | 18.46 | 27 | 20.77 | 15 | 11.54 | 123 | 94.62 | 7 | 5.38 |
| 24. හැටන් | 84 | 33 | 39.29 | 14 | 16.67 | 18 | 21.43 | 11 | 13.10 | 76 | 90.48 | 8 | 9.52 |
| 25. වලපනේ | 9 | 2 | 22.22 | 1 | 11.11 | 3 | 33.33 | 3 | 33.33 | 9 | 100.00 | 0 | 0.00 |
| 26. හඟුරන්කෙත | 4 | 0 | 0.00 | 1 | 25.00 | 2 | 50.00 | 0 | 0.00 | 3 | 75.00 | 1 | 25.00 |
| 27. ගාල්ල | 485 | 177 | 36.49 | 68 | 14.02 | 96 | 19.79 | 77 | 15.88 | 418 | 86.19 | 67 | 13.81 |
| 28. ඇල්පිටිය | 23 | 9 | 39.13 | 6 | 26.09 | 4 | 17.39 | 4 | 17.39 | 23 | 100.00 | 0 | 0.00 |
| 29. අම්බලන්ගොඩ | 23 | 10 | 43.48 | 4 | 17.39 | 8 | 34.78 | 0 | 0.00 | 22 | 95.65 | 1 | 4.35 |
| 30. උඩුගම | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 31. මාතර | 266 | 133 | 50.00 | 32 | 12.03 | 42 | 15.79 | 34 | 17.78 | 241 | 90.60 | 25 | 9.40 |
| 32. අකුරැස්ස | 75 | 32 | 42.67 | 12 | 16.00 | 13 | 17.33 | 12 | 16.00 | 69 | 92.00 | 6 | 8.00 |
| 33. මුලටියන-හක්මණ | 22 | 10 | 45.45 | 4 | 18.18 | 1 | 4.55 | 4 | 18.18 | 19 | 86.36 | 3 | 13.64 |
| 34. මොරවක-දෙනියාය | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 |
| 35. තංගල්ල | 10 | 3 | 30.00 | 5 | 50.00 | 1 | 10.00 | 0 | 0.00 | 9 | 90.00 | 1 | 10.00 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 114 | 45 | 39.47 | 22 | 19.30 | 18 | 15.79 | 12 | 10.53 | 97 | 85.09 | 17 | 14.91 |
| 37. වලස්මුල්ල | 14 | 4 | 28.57 | 3 | 21.43 | 4 | 28.57 | 2 | 14.29 | 13 | 92.86 | 1 | 7.14 |
| 38. යාපනය | 13 | 1 | 7.69 | 2 | 15.38 | 2 | 15.38 | 4 | 30.77 | 9 | 69.23 | 4 | 30.77 |
| 39. දූපත | 3 | 0 | 0.00 | 2 | 66.67 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 66.67 | 1 | 33.33 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 41. වලිකාමන් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 43. කිලිනොච්චි | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 |
| 44. මන්නාරම | 133 | 40 | 30.08 | 19 | 14.29 | 25 | 18.80 | 35 | 26.32 | 119 | 89.47 | 14 | 10.53 |
| 45. මඩු | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 |
| 46. වව්නියාව | 156 | 36 | 23.08 | 26 | 16.67 | 36 | 23.08 | 47 | 30.13 | 145 | 92.95 | 11 | 7.05 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 48. මුලතිව් | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 50. මඩකලපුව | 89 | 47 | 52.81 | 15 | 16.85 | 17 | 19.10 | 4 | 4.49 | 83 | 93.26 | 6 | 6.74 |
| 51. කල්කුඩා | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 52. පදිරිප්පු | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 1292 | 627 | 48.53 | 266 | 20.59 | 254 | 19.66 | 114 | 8.82 | 1261 | 97.60 | 31 | 2.40 |
| 54. අම්පාර | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 55. කල්මුනේ | 1400 | 581 | 41.50 | 246 | 17.57 | 291 | 20.79 | 228 | 16.29 | 1346 | 96.14 | 54 | 3.86 |
| 56. සමන්තුරෙයි | 794 | 279 | 35.14 | 115 | 14.48 | 194 | 24.43 | 134 | 16.88 | 722 | 90.93 | 72 | 9.07 |
| 57. මහඔය | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 58. දෙහිඅත්තකන්ඩිය | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 59. අක්කරෙයිපත්තුව | 1057 | 509 | 48.16 | 226 | 21.38 | 227 | 21.48 | 89 | 8.42 | 1051 | 99.43 | 6 | 0.57 |
| 60. ත්‍රිකුණාමලය | 332 | 93 | 28.01 | 53 | 15.96 | 71 | 21.39 | 70 | 21.08 | 287 | 86.45 | 45 | 13.55 |
| 61. මුතූර් | 607 | 200 | 32.95 | 116 | 19.11 | 146 | 24.05 | 102 | 16.80 | 564 | 92.92 | 43 | 7.08 |
| 62. කන්තලේ | 122 | 20 | 16.39 | 20 | 16.39 | 38 | 31.15 | 25 | 20.49 | 103 | 84.43 | 19 | 15.57 |
| 63. කින්නියා | 1071 | 305 | 28.48 | 189 | 17.65 | 260 | 24.28 | 218 | 20.35 | 972 | 90.76 | 99 | 9.24 |
| 64. කුරුණෑගල | 377 | 135 | 35.81 | 58 | 15.38 | 72 | 19.10 | 70 | 18.57 | 335 | 88.86 | 42 | 11.14 |
| 65. කුලියාපිටිය | 218 | 69 | 31.65 | 57 | 26.15 | 38 | 17.43 | 37 | 16.97 | 201 | 92.20 | 17 | 7.80 |
| 66. නිකවැරටිය | 166 | 76 | 45.78 | 38 | 22.89 | 24 | 14.46 | 20 | 12.05 | 158 | 95.18 | 8 | 4.82 |
| 67. මහව | 138 | 31 | 22.46 | 21 | 15.22 | 22 | 15.94 | 40 | 28.99 | 114 | 82.61 | 24 | 17.39 |
| 68. ගිරිඋල්ල | 524 | 212 | 40.46 | 101 | 19.27 | 101 | 19.27 | 82 | 16.65 | 496 | 94.66 | 28 | 5.34 |
| 69. ඉබ්බාගමුව | 230 | 72 | 31.30 | 37 | 16.09 | 51 | 22.17 | 53 | 23.04 | 213 | 92.61 | 17 | 7.39 |
| 70. පුත්තලම | 1595 | 499 | 31.29 | 317 | 19.87 | 388 | 24.33 | 281 | 17.62 | 1485 | 93.10 | 110 | 6.90 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 71. හලාවත | 184 | 69 | 37.50 | 30 | 16.30 | 40 | 21.74 | 29 | 15.76 | 168 | 91.30 | 16 | 8.70 |
| 72. අනුරාධපුරය | 276 | 101 | 36.59 | 57 | 20.65 | 57 | 20.65 | 45 | 16.30 | 260 | 94.20 | 16 | 5.80 |
| 73. තඹුත්තේගම | 41 | 15 | 36.59 | 3 | 7.32 | 12 | 29.27 | 8 | 19.51 | 38 | 92.68 | 3 | 7.32 |
| 74. කැකිරාව | 285 | 96 | 33.68 | 39 | 13.68 | 63 | 22.11 | 63 | 22.11 | 261 | 91.58 | 24 | 8.42 |
| 75. ගලෙන්බිඳුනුවැව | 125 | 28 | 22.40 | 35 | 28.00 | 29 | 23.20 | 21 | 16.80 | 113 | 90.40 | 12 | 9.60 |
| 76. කැබිතිගොල්ලෑව | 62 | 19 | 30.65 | 14 | 22.58 | 14 | 22.58 | 12 | 19.35 | 59 | 95.16 | 3 | 4.84 |
| 77. පොළොන්නරුව | 214 | 87 | 40.65 | 45 | 21.03 | 52 | 24.30 | 27 | 12.62 | 211 | 98.60 | 3 | 1.40 |
| 78. හිඟුරක්ගොඩ | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 79. දිඹුලාගල | 13 | 1 | 7.69 | 2 | 15.38 | 7 | 53.85 | 2 | 15.38 | 12 | 92.31 | 1 | 7.69 |
| 80. බදුල්ල | 175 | 63 | 36.00 | 48 | 27.43 | 33 | 18.86 | 17 | 9.71 | 161 | 92.00 | 14 | 8.00 |
| 81. බණ්ඩාරවෙල | 114 | 28 | 24.56 | 19 | 16.67 | 27 | 23.68 | 24 | 21.05 | 98 | 85.96 | 16 | 14.04 |
| 82. මහියංගනය | 10 | 0 | 0.00 | 0 | 0.00 | 3 | 30.00 | 2 | 20.00 | 5 | 50.00 | 5 | 50.00 |
| 83. වැලිමඩ | 256 | 81 | 31.64 | 48 | 18.75 | 70 | 27.34 | 44 | 17.19 | 243 | 94.92 | 13 | 5.08 |
| 84. පස්සර | 39 | 7 | 17.95 | 4 | 10.26 | 14 | 35.90 | 6 | 15.38 | 31 | 79.49 | 8 | 20.51 |
| 85. මොණරාගල | 17 | 4 | 23.53 | 2 | 11.76 | 5 | 29.41 | 3 | 17.65 | 14 | 82.35 | 3 | 17.65 |
| 86. වැල්ලවාය | 5 | 1 | 20.00 | 1 | 20.00 | 0 | 0.00 | 1 | 20.00 | 3 | 60.00 | 2 | 40.00 |
| 87. බිබිල | 74 | 20 | 27.03 | 16 | 21.62 | 22 | 29.73 | 7 | 9.46 | 65 | 87.84 | 9 | 12.16 |
| 88. රත්නපුර | 114 | 23 | 20.18 | 22 | 19.30 | 27 | 23.68 | 21 | 18.42 | 93 | 81.58 | 21 | 18.42 |
| 89. බළන්ගොඩ | 77 | 24 | 31.17 | 13 | 16.88 | 21 | 27.27 | 15 | 19.48 | 73 | 94.81 | 4 | 5.19 |
| 90. නිවිතිගල | 0 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| 91. ඇඹිලිපිටිය | 40 | 15 | 37.50 | 8 | 20.00 | 11 | 27.50 | 6 | 15.00 | 40 | 100.00 | 0 | 0.00 |
| 92. කෑගල්ල | 114 | 42 | 36.84 | 24 | 21.05 | 18 | 15.79 | 19 | 16.67 | 103 | 90.35 | 11 | 9.65 |
| 93. මාවනැල්ල | 775 | 336 | 43.35 | 139 | 17.94 | 141 | 18.19 | 94 | 12.13 | 710 | 91.61 | 65 | 8.36 |
| 94. දෙහිඕවිට | 144 | 66 | 45.83 | 23 | 15.97 | 28 | 19.44 | 20 | 13.89 | 137 | 95.14 | 7 | 4.86 |
| **සමස්ත දිවයින** | **23272** | **8582** | **36.88** | **4107** | **17.65** | **4912** | **21.11** | **3704** | **15.92** | **21305** | **91.55** | **1967** | **8.45** |

වගුව 4

1.2.5. මුළු ලකුණු ලබා ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 1 | 0.00 | 31348 | 100.00 |
| 81 - 90 | 115 | 0.37 | 31347 | 100.00 |
| 71 - 80 | 694 | 2.21 | 31232 | 99.63 |
| 61 - 70 | 1639 | 5.23 | 30538 | 97.42 |
| 51 - 60 | 2833 | 9.04 | 28899 | 92.19 |
| 41 - 50 | 3839 | 12.25 | 26066 | 83.15 |
| 31 - 40 | 5021 | 16.02 | 22227 | 70.90 |
| 21 - 30 | 5826 | 18.58 | 17206 | 54.89 |
| 11 - 20 | 6081 | 19.40 | 11380 | 36.30 |
| 01 - 10 | 4513 | 14.40 | 5299 | 16.90 |
| 00 - 00 | 786 | 2.51 | 786 | 2.51 |


වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙම විෂයය සඳහා ලකුණු 71 - 80 අතර ලකුණු ලබාගත් සංඛ්‍යාව 694කි. එය ප්‍රතිශතයක් වශයෙන් **2.21%**කි. ලකුණු **30**ට හා ඊට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව **17,206** ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් **54.89%** කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ඉහත ප්‍රස්තාරයට අනුව, ප්‍රශ්න අංක 1, 2, 3, 5, 9, 11, 16, 23, 24, 26, 27, 28, 29, 34, 35, 36 හා 40 යන ප්‍රශ්න 17 සඳහා 70% හෝ එයට වැඩි ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇති අතර, ප්‍රශ්න අංක 10සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 06% කි. ඒ අනුව පහසුතාව අඩුම ප්‍රශ්නය ප්‍රශ්න අංකයට 10 වේ. එසේම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ ප්‍රශ්න අංක 35 කි. එය 93% කි

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- ප්‍රශ්න අංක 01 අනිවාර්ය ප්‍රශ්නයක් වුවත් ඒ සඳහා පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 98%ක් පමණි. ප්‍රශ්න අංක 05 අයදුම්කරුවන්ගෙන් 42% ක් පමණ තෝරාගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙහි 1වන ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින්, ලකුණු 16-20 (76%-100%) අතර ලබාගත් අයදුම්කරුවන් 29%ක් පමණ වේ. ලකුණු 11-15 (51%-75%) අතර ලබා ගත් අයදුම්කරුවන් 35% ක් පමණ වේ. ලකුණු 6-10 (26%-50%) අතර ලබාගත් අයදුම්කරුවන් 24% පමණ වේ. ලකුණු 0-5 (00%-25%) අතර ලබාගත් අයදුම්කරුවන් 12% පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4. **II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය**




**ප්‍රස්තාරය 4** (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 2වන ප්‍රශ්නයේ එක් එක් කොටස සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ ප්‍රතිශතය (i) කොටස සඳහා 69% ක් ද, (ii) කොටස සඳහා 55% ක් ද, (iii) කොටස සඳහා 66% ක් ද වේ.

# II කොටස

## 2 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 01 කි. මුළු ලකුණු 40 කි.

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත විය.

එක් එක් ප්‍රශ්නය සඳහා දෙන ලද පිළිතුරු වරණ 4 අතුරින් ඉතා නිවැරදි එක් පිළිතුරක් තෝරා පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරිණි.

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

1. මුස්ලිම් කෙනෙකු සුබහ් සලාතයේ දී අනිවාර්යයෙන් ම පාරායනය කළ යුතු සූරාව
   (1) සූරා ඉක්ලාස් ය.
   (2) සූරා අල් ගාසියා ය.
   (3) සූරා ෆාතිහා ය.
   (4) සූරා අස් සජ්දා ය.

2. ඔබේ ඇඳුමේ නජීසය ඉවත් කිරීමට හෝ ඔබේ පිපාසය සංසිඳවීමට හෝ සාමාන්‍යයෙන් භාවිත කළ නොහැකි ජලය
   (1) මා උන් මුත්ලක් ය.
   (2) මා උන් තාහිර් ය.
   (3) මා උන් තහූර් ය.
   (4) මා උන් මුතනජ්ජිස් ය.

3. අල්ලාහ් විසින් මිනිසුන්ට අනුමත කරන ලද, එහෙත් ඔහු වඩාත් අප්‍රිය කරන ක්‍රියාව
   (1) සිර්ක් ය.
   (2) මිනීමැරීම ය.
   (3) කබායිර් ය.
   (4) තලාක් ය.

4. යම් යහපත් ක්‍රියාවක් ජනතාවගේ ප්‍රශංසාව හා ගෞරවය බලාපොරොත්තුවෙන් කිරීම
   (1) කුසල් ලබා දෙයි.
   (2) ආදේශ කිරීමට සමානයි.
   (3) අල්ලාහ්ගේ ප්‍රශංසාවට ලක් වෙයි.
   (4) ධර්මයෙන් වෙන් වීමට සමානයි.

5. ඔබට යම්කිසි මාසයකදී සුන්නත් (වෛකල්පික) උපවාස දෙකක් ඉටුකිරීමට අවශ්‍ය වූ විට, එයට වඩාත් සුදුසු වන්නේ
   (1) සඳුද සහ බ්‍රහස්පතින්ද ය.
   (2) බ්‍රහස්පතින්දා සහ සිකුරාද ය.
   (3) සෙනසුරාද සහ ඉරිද ය.
   (4) සඳුද සහ අඟහරුවාද ය.

6. පරිසරය පිරිසිදුව හා ලස්සනට තබා ගැනීමත් පොළොවේ ගස් සිටුවා හරිතවත් කිරීමත්
   (1) කිලාබත් ක්‍රියාවකි.
   (2) ඉබාදත් ක්‍රියාවකි.
   (3) ඉමාරත් ක්‍රියාවකි.
   (4) ඉරාදත් ක්‍රියාවකි.

7. සිකුරාද මුස්ලිම් කෙනෙකු ජුම්ආවට සහභාගි වීමට පෙර ස්නානය කිරීම
   (1) වාජිබ් වේ.
   (2) සුන්නත් වේ.
   (3) ෆර්ල් (අනිවාර්ය) වේ.
   (4) මක්රූහ් වේ.

8. 'දිළින්දන්ගේ මව' යන ගෞරව නාමයෙන් අමතනු ලබන්නේ
   (1) සෙයිනබ් බින්ද් හුසෙමා (රලි) ය.
   (2) ආයිෂා බින්ද් අබූබකර් (රලි) ය.
   (3) හබ්සා බින්ද් උමර් (රලි) ය.
   (4) කදීජා බින්ද් කුවෛලිද් (රලි) ය.

9. වැන්දඹුවක වූ කාන්තාවක් ඉද්ද සිටිය යුතු කාල සීමාව
   (1) දින හතළිහකි.
   (2) මාස හතරකි.
   (3) මාස හතරක් සහ දින දහයකි.
   (4) මාස තුනකි.

10. ඉස්ලාම් ශිෂ්ටාචාරය උච්ඡස්ථානයේ දක්නට ලැබුණු නගර දෙක වනුයේ
    (1) මක්කා සහ මදීනා ය.
    (2) කූෆා සහ බසරා ය.
    (3) කාහිරා සහ දිල්ලි ය.
    (4) කෝර්ඩෝවා සහ බැග්ඩෑඩ් ය.

11. ඔබ නින්දට යාමට ප්‍රථමයෙන් ඔබේ එද දවසේ ක්‍රියාවන් නැවත මතක් කර ගැනීම
    (1) මුහාසබා වෙයි.
    (2) මුනාකිහා වෙයි.
    (3) ඉහ්සාන් වෙයි.
    (4) කව්ෆ් වෙයි.

12. මුආවියා (රලි) තුමා ආරම්භ කළ පාලනය
    (1) අරාබි දේශයේ උමෙයා පාලනයයි.
    (2) ස්පෙන්හි උමෙයා පාලනයයි.
    (3) ඊජිප්තුවේ ෆාතිමියියා පාලනයයි.
    (4) තුර්කියේ උස්මානියා පාලනයයි.

13. 'අහ්ලුස්සුන්නා වල්ජමාඅත්' නමින් හඳුන්වනු ලබන්නෝ
    (1) විශ්වාසයට හෝ ක්‍රියාවට හෝ මුල් තැන නොදෙන්නෝ ය.
    (2) විශ්වාසය හා ක්‍රියාව සමානව දකින්නෝ ය.
    (3) විශ්වාසයට වඩා ක්‍රියාවට මුල් තැන දෙන්නෝ ය.
    (4) ක්‍රියාවට වඩා විශ්වාසයට මුල් තැන දෙන්නෝ ය.

14. 'අ' පේළිය යටතේ යෙදී ඇති වචනවලට ගැළපෙන සේ 'ආ' පේළිය යටතේ ඇති වචන පෙළගැස්වූ විට ලැබෙන නිවැරදි පිළිවෙළ කුමක් ද?

| 'අ' | 'ආ' |
|---|---|
| (i) භූගෝල විද්‍යාව | *A.* අල්කානූන් ෆිත්තිබ් |
| (ii) ගණිතය | *B.* කිතාබුල් හයවාන් |
| (iii) ජීව විද්‍යාව | *C.* කිතාබු සූරතුල් අර්ල් |
| (iv) වෛද්‍ය විද්‍යාව | *D.* අල් ජබ්ර් වල්මුකාබලා |

(1) *A, C, B, D* (2) *C, D, A, B* (3) *C, D, B, A* (4) *D, C, B, A*

15. 'හජ්' නමැදුමේ දී අවසන් වරට ඉටු කරන තවාෆය

(1) තවාෆුල් කුදූම් ය. (2) තවාෆුල් විදා ය. (3) තවාෆුල් කෑබා ය. (4) තවාෆුල් සබ්ආ ය.

16. "ඔබ මිනිසුන්ට උදව් කරන්නෙහි ය; දුප්පතුන්ට දන් දෙන්නෙහි ය; නෑදයන් ළඟින් ඇසුරු කරන්නෙහි ය. එහෙයින් අල්ලාහ් ඔබ අත්නොහරින්නේ ය." යනුවෙන් නබි (සල්) තුමන්ට සැනසිලි බස් දෙඩුවේ

(1) වරකත් බින් නව්ෆල් ය. (2) හලීමා (රළි) ය.
(3) ෆාතිමා (රළි) ය. (4) කදීජා (රළි) ය.

17. සහාබාවරු අතරේ 'නීතිය' අතින් 'ඉජ්තිහාද්' පර්යේෂණයේ ප්‍රසිද්ධියක් උසුලන්නේ

(1) අබූ හුරෙරා (රළි), මුආස් ඉබ්නු ජබල් (රළි), සල්මානුල් ෆාර්සි (රළි) හා බිලාල් (රළි) ය.
(2) ආයිෂා (රළි), සෙඳ් ඉබ්නු සාබිත් (රළි), මුආවියා (රළි) හා උස්මාන් (රළි) ය.
(3) මාලික් (රහ්), අබූහනීෆා (රහ්), ෂාෆි (රහ්) හා අහ්මද් ඉබ්නු හම්බල් (රහ්) ය.
(4) උමර් (රළි), අලි (රළි), ඉබ්නු අබ්බාස් (රළි) හා ඉබ්නු මාස්ඌද් (රළි) ය.

18. වරදේ ස්වභාවය, එය සිදු වූ පරිසරය, එහි බලපෑම ආදිය සලකා බලා විනිශ්චයකරුවා 'ඉජ්තිහාද්' මගින් ලබා දෙන දඬුවම

(1) තඃසීර් ය. (2) හුදූද් ය. (3) කිසාස් ය. (4) දියත් ය.

19. තමා විසින් පත්කරන ලද සහාබාවරුන් හයදෙනා රැස් වී තමාගේ මරණයෙන් පසු තමන් අතුරෙන් කෙනෙකු නායකත්වයට තෝරා ගන්නා ලෙස ප්‍රකාශ කළේ

(1) අබූබකර් (රළි) ය. (2) උමර් (රළි) ය. (3) උස්මාන් (රළි) ය. (4) අලි (රළි) ය.

20. නබි (සල්) තුමාගේ ලිපිය ඊජිප්තුවේ රජතුමා වෙතට රැගෙන ගිය සහාබිවරයා

(1) හාතිබ් ඉබ්නු අබී බල්තආ (රළි) ය. (2) අබ්දුල්ලාහ් ඉබ්නු හුසෙමා (රළි) ය.
(3) තිහියයතුල් කල්බි (රළි) ය. (4) අම්ර් ඉබ්නු උමෙයා (රළි) ය.

21. ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගෙන් බහුතරයක් පිළිපදින 'මද්හබය'

(1) හනෆි මද්හබ් ය. (2) ෂාෆි මද්හබ් ය. (3) මාලික් මද්හබ් ය. (4) හන්බලි මද්හබ් ය.

22. ඉස්ලාම් නීති සංග්‍රහයේ 'කියාස්' නීති මූලාශ්‍රවලින් එකක් ලෙස හඳුන්වා දෙන ලද්දේ

(1) ඉමාම් අහමද් (රහ්) ය. (2) ඉමාම් මාලික් (රහ්) ය.
(3) ඉමාම් ෂාෆි (රහ්) ය. (4) ඉමාම් අබූ හනීෆා (රහ්) ය.

23. 'ඉද්ද' ඉටුකරන කාන්තාවක විසින් කිරීමට අනුමත වූ ක්‍රියාවක් වනුයේ

(1) විවාහ වීම ය. (2) විවාහ යෝජනා ගෙන ඒම ය.
(3) රාත්‍රියේ නිවසෙන් බැහැරව යාම ය. (4) අසනීප වූවහොත් වෛද්‍යවරයා හමුවීම ය.

24. පර්ල් ඓන්වලට අයත් එක් ක්‍රියාවක් වනුයේ

(1) වෛද්‍යවරුන් බිහිකරවීම ය. (2) මස්ජිද් ගොඩනැගීම ය.
(3) දෙගුරුන්ට ගරු කිරීම ය. (4) පරිසරය සුරැකීම ය.

25. මුස්ලිම්වරුන්ගේ පළමු 'කිබ්ලාව' වූ මස්ජිදුල් අක්ෂාව පිහිටි ස්ථානය

(1) මක්කම ය. (2) මදීනාව ය. (3) කුෆාව ය. (4) ජෙරුසලම ය.

26. සකාත් බද්දට ඇතුළත් වන දේවල් වනුයේ

(1) රන්, රිදී සහ වතු ය. (2) වාහන, භාණ්ඩ සහ වී ය.
(3) තිරිඟු, රටඉඳි සහ නිවාස ය. (4) එළුවන්, රත්තරන් සහ රටඉඳි ය.

27. ඉමාම් බුහාරි (රහ්) පඬිවරයෙකු ලෙස ප්‍රසිද්ධියක් ලැබුයේ

(1) තෆ්සීර් පිළිබඳව ය. (2) හදීස් පිළිබඳව ය.
(3) ඉතිහාසය පිළිබඳව ය. (4) වෛද්‍ය විද්‍යාව පිළිබඳව ය.

28. නවීන නීතිමය ගැටලු විසඳ ගැනීම සඳහා ඉස්ලාමය ඉදිරිපත් කරන මාර්ගය
(1) ඡන්ද විමසීම ය. (2) ෂූරා ය. (3) ඉජ්තිහාද් ය. (4) දෑවා ය.

29. ශ්‍රී ලංකාවේ ඉස්ලාමය හඳුන්වා දීමට මූලික වූයේ
(1) සහාබාවරු ය. (2) අරාබි පාලකයෝ ය.
(3) අරාබි වෙළෙන්දෝ ය. (4) ආධ්‍යාත්මික නායකයෝ ය.

30. ඉස්ලාමීය මනෝ විද්‍යාව පිළිබඳ පර්යේෂණ ඉදිරිපත් කළේ
(1) ඉමාම් මාලික් (රහ්) ය. (2) අබ්දුල් කාදිර් ජීලානි (රහ්) ය.
(3) ඉමාම් සමක්ෂරි (රහ්) ය. (4) ඉමාම් ගස්සාලි (රහ්) ය.

31. උම්රාවේ අර්කාන්වලට අයත් **නොවන** ක්‍රියාවක් වනුයේ
(1) තවාෆ් කිරීම ය. (2) අරෆාවේ රැඳීම ය. (3) සෑයු කිරීම ය. (4) හිසකෙස් ඉවත් කිරීම ය.

32. පහත සඳහන් ඒවායින් කාලසීමාවක් නියමිත වූ යහක්‍රියාවන් දෙක වනුයේ
(1) ෆිත්රා සහ සදකා ය. (2) උළ්හියියා සහ හිබත් ය.
(3) උළ්හියියා සහ ෆිත්රා ය. (4) අකීකා සහ සදකා ය.

33. ෂව්වාල් මුල් හඳ දැකීමෙන් පසු උපවාසයේ යෙදීම
(1) හරාම් වේ. (2) මක්රූහ් වේ. (3) වාජිබ් වේ. (4) ජාඉස් වේ.

34. 'අහ්ලුල් බෛත්' යන්නෙන් අදහස් කරනුයේ කුමක් ද?
(1) නබි (සල්) තුමාගේ පවුලේ අය (2) නබි (සල්) තුමාගේ ප්‍රාතිහාර්යයන්
(3) නබි (සල්) තුමාගේ මිතුරන් (4) පෙර දහම් පිළිපදින්නන්

35. වස්තුව මගින් ඉටුකරන ඉබාදතයක් වනුයේ
(1) කලිමා ය. (2) සලාත් ය. (3) හජ් ය. (4) සකාත් ය.

36. 'අවසන් නබිවරයා' යන අදහස දෙන අල්කුර්ආනයේ වදන් පෙළ
(1) රහ්මතන්ලිල් ආලමීන් නම් වේ. (2) හාතමුන් නබිය්යීන් නම් වේ.
(3) ෂෆීඋල් මුස්නිබීන් නම් වේ. (4) සය්යිදුල් මුර්සලීන් නම් වේ.

37. ජමාඅත් සමඟ අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු සලාතය
(1) තරාවීහ් ය. (2) ජනාසා ය. (3) අවුරුදු උත්සව ය. (4) ජුම්ආ ය.

38. 'බෛතුල්හික්මා' නමැති අධ්‍යාපන ආයතනය නිර්මාණය කර අධ්‍යාපනයට සේවය කළ කලීෆාවරයා වනුයේ
(1) කලීෆා මෑමූන් ය. (2) කලීෆා මුතවක්කිල් ය.
(3) කලීෆා හාරූන් රෂීද් ය. (4) කලීෆා මුආවියා ය.

39. ඉස්ලාමීය කිලාෆතය ලෝකයේ පරිහානියට පත් අවුරුද්ද කුමක් ද?
(1) ක්‍රි.ව. 1505 (2) ක්‍රි.ව. 1806 (3) ක්‍රි.ව. 1924 (4) ක්‍රි.ව. 1948

40. මුස්ලිම්වරයෙකු 'වුළූ' රහිතව **නොකළ** යුතු ක්‍රියාවක් වනුයේ
(1) සලාතය ය. (2) කුර්ආන් පාරායනය ය.
(3) ඉෑතිකාෆ් ඉඳීම ය. (4) තව්බා අයදීම ය.

2.1.3. අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | ...3... | 21 | ...2... |
| 02 | ...4... | 22 | ...4... |
| 03 | ...4... | 23 | ...4... |
| 04 | ...2... | 24 | ...3... |
| 05 | ...1... | 25 | ...4... |
| 06 | ...3... | 26 | ...4... |
| 07 | ...2... | 27 | ...2... |
| 08 | ...1... | 28 | ...3... |
| 09 | ...3... | 29 | ...3... |
| 10 | ...4... | 30 | ...4... |
| 11 | ...1... | 31 | ...2... |
| 12 | ...1... | 32 | ...3... |
| 13 | ...2... | 33 | ...1... |
| 14 | ...3... | 34 | ...1... |
| 15 | ...2... | 35 | ...4... |
| 16 | ...4... | 36 | ...2... |
| 17 | ...4... | 37 | ...4... |
| 18 | ...1... | 38 | ...1... |
| 19 | ...2... | 39 | ...3... |
| 20 | ...1... | 40 | ...1... |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

## 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

* **I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 ඇසුරෙන් සකස් කර ඇත.**

- 1 වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සළකා බැලීමේදී ප්‍රශ්න අංක 1,2, 3, 5, 9, 11, 16, 23, 24, 26, 27, 28, 29, 34, 35, 36 හා 40 යන ප්‍රශ්න දාහත සඳහා අයදුම්කරුවන්ගෙන් 70% හෝ එයට වැඩි ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. 30% ට අඩු ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ ප්‍රශ්න අංක 6, 10, 20 හා 38 සඳහාය.

- ප්‍රශ්න අංක 14, 17, 19, 22, 30, 31 හා 39 යන ප්‍රශ්න සඳහා නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 30%-50% පමණ පිරිසකි.

- ප්‍රශ්න අංක 4, 7, 12, 13, 15, 18. 21, 25, 32, 33 හා 37 යන ප්‍රශ්න සඳහා නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 50%-70% අතර ප්‍රමාණයකි.

- ප්‍රශ්න අංක 10, 20, 38 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී අයදුම්කරුවන් දුර්වලතා දැක්වීමට හේතු වී ඇත්තේ ඉස්ලාමීය ශිෂ්‍යටාචාරය (අස් - සීරාහ් වත්තාරිහ්) පිළිබඳ දැනුම අඩු වීමය. එසේම පෙළ පොතේ අවසාන තේමාව වන දෛනික කටයුතු පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය හෙවත් මආහිමුල් ඉස්ලාමියියා පිළිබඳ දැනුම ලබා ගැනීමේ දුර්වලතා දැක්වීම ද හේතු වී ඇත. ප්‍රශ්න අංක 10 සඳහා 6%ක් පමණ ඉතා අඩු පිරිසක් නිවැරදි පිළිතුරු සපයා ඇත.

- එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළ පොතේ අවසාන තේමාව කෙරෙහි යොමු වන අවධානය අඩු බව නිගමනය කළ හැකිය.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- කාලය පැය 02 කි. මුළු ලකුණු 60 කි.
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10 කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 ක් බැගින් මුළු ලකුණු 20 කි.
- සෙසු ව්‍යුහගත ප්‍රශ්න 6 න් 4 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40 කි.

2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ හා නිගමන

## A කොටස - ව්‍යුහගත රචනා

1 ප්‍රශ්නය

(1) **අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**1.** **(i) රම්සාන් මස ඉටුකරන ප්‍රධාන සුන්නත් ක්‍රියා දෙකක් සඳහන් කරන්න.**
**(ii) උපවාසයේ පර්ල් දෙක නම් කරන්න.**
**(iii) ඉස්ලාම් කාන්තාවන්ට ලබා දී ඇති ප්‍රධාන අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න.**
**(iv) ඉස්ලාමීය ආර්ථිකයේ තහනම් වූ ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න.**
**(v) මුස්ලිම්වරයෙකුට ස්නානය අනිවාර්ය වන අවස්ථා දෙකක් සඳහන් කරන්න.**
**(vi) ඉමාම් ෂාෆි (රහ්) තුමාගේ ග්‍රන්ථ දෙකක් නම් කරන්න.**
**(vii) 'කියාස්' යන්නෙහි අර්ථය කුමක් ද?**
**(viii) 'හදීස්' යන පදයේ තේරුම කුමක් ද?**
**(ix) ඉස්ලාමීය කාන්තාවකගේ 'අව්රතය' කුමක් ද?**
**(x) කලීෆා අබුබකර් (රලි) තුමා තම පාලන සමයේ මුහුණ දුන් ප්‍රධාන අභියෝග දෙකක් සඳහන් කරන්න.**

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1 ප්‍රශ්නය

(i)
- සහර් කිරීම
- හිරු සම්පූර්ණයෙන් බැස යෑමෙන් අනතුරුව සව්ම් හැරීම
- සව්ම් හැරීමෙන් පසු දුආ ඉල්ලී
- සව්ම්දාරීන් සව්ම් හැරීමට සහාය වීම
- බොරු කීම, කේලම් කීම, බැන වැදීම වැනි අනවශ්‍ය කථාවලින් කට රැක ගැනීම.
- අල්කුර්ආන් පාරායනය කිරීම, දික්ර් කිරීම වැඩි වශයෙන් කිරීම.
- අල්ලාහ්ගෙන් වැඩි වශයෙන් දුආ ඉල්ලීම.
- සදකා වැනි දන්දීම් වැඩි වශයෙන් ඉටු කිරීම
- රාමලාන් මාසයේ රාත්‍රීවල තරාවීහ්, කියාමුල් ලෛල්, විතර් වැනි රාත්‍රී නැමදුම්වල නියැලීම.
- මස්ජිද්වල අල්ලාහ් වෙනුවෙන් ඉෘතිකාෆ් සිටීම.
- සංගීතය, නර්තනය, රූපවාහිනී, චිත්‍රපටි, වැඩසටහන්වලින් ඇස, කන, දිව, යනාදී අවයව රැක ගැනීම.

ඉහත කරුණුවලින් 02 ක් ලියා ඇත්නම් ලකුණක් බැගින් ලබා දෙන්න.

1 x 2 = ලකුණු 2

(ii) • නියියත් තැබීම.
• අරුණෝදයේ සිට හිරු සම්පූර්ණයෙන් බැස යන තුරු උපවාසය බිඳෙන කටයුතුවලින් වැලකී සිටීම.

1 x 2 = ලකුණු 2

(iii) • අධ්‍යාපනය ලබා ගැනීම.
• කථා කිරීමේ අයිතිය.
• රැකියාවේ නියැලීමේ අයිතිය.
• නිදහසේ ජීවත් වීමේ අයිතිය.
• විවාහ වීමේ අයිතිය.
• විවාහ යෝජනා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය.

(iv) • කිරුම් මිණුම්වලදී වංචා කිරීම.
• පොළිය
• අනවශ්‍ය ලෙස දිව්රීම.
• භාණ්ඩ සඟවා තැබීම.
• බොරු කීම.
• සොරාගත් බඩු විකිණීම.
• හොඳ දේවල්ට බාල දේ මිශ්‍ර කිරීම.

ඉහත කරුණුවලින් 02 ක් ලියා ඇත්නම් ලකුණක් බැගින් ලබා දෙන්න.

1 x 2 = ලකුණු 2

(v) • මුස්ලිම්වරයෙකු මරණයට පත්වීම.
• ශුක්‍රාණු පිටවීම.
• හෛළු - මාස්ශුද්ධිය ඇති වීම.
• නිෆාස් ලේ වහනය
• ස්ත්‍රී පුරුෂ සංසර්ගයේ යෙදීම

(vi) • කිතාබුල් උම්ම්
• අර්රිසාලා
• අල් මුහ්නද්
• අහ්කාමුල් කුර්ආන්
• ජිමාඋල් ඉල්ම්

ඉහත කරුණුවලින් 02 ක් ලියා ඇත්නම් ලකුණක් බැගින් ලබා දෙන්න.

1 x 2 = ලකුණු 2

(vii) • අල් කුර්ආන්, අස්සුන්නා, අල් ඉජ්මාඋ යන නීති මූලාශ්‍ර මගින් නැත්නම් මින් එකක් මගින් ලබාගත් තීන්දුවක් සාධක ෙ කාට ගෙන අලුත් ගැටලුවක් අනුමාන කිරීම මගින් ලබා දෙන තීන්දුව කියාස් නම් වේ.

ඉහත කරුණුවලින් 02 ක් ලියා ඇත්නම් ලකුණක් බැගින් ලබා දෙන්න.

1 x 2 = ලකුණු 2

(viii) නබි (සල්) තුමාණන්ගේ කතා, ක්‍රියා, අනුමැතිය සහ එතුමාණන් සතු ගුණාංග ඇතුළත් කරුණු හදීස් නම් වේ.
මෙවැනි පිළිතුර ලියා ඇත්නම් ලකුණු 02 ක් ලබා දෙන්න.

(ix) ස්ත්‍රියකගේ මුහුණ හා දෙඅත්හි මැණික් කටුව දක්වා වූ අවයව හැර අන් සියලු අවයවයන් ආවරණය වී තිබිය යුතුය.
ඉහත පිළිතුර ලියා ඇත්නම් ලකුණු 02 ක් ලබා දෙන්න.

(x)
- ව්‍යාජ නබිවරුන් පැමිණීම
- සකාත් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම.
- ආගම් වෙනස් කිරීම.

ඉහත කරුණු 02ක් ලියා ඇත්නම් ලකුණු 01 බැගින් ලබා දෙන්න.

2 x 10 = ලකුණු 20

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙය අනිවාර්ය ප්‍රශ්නයකි. එබැවින් සමස්ථ අපේක්ෂකයන්ගෙන් 98% මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (1 ප්‍රස්ථාරය ඇසුරින්). මෙම ප්‍රශ්නය කොටස් 10 කින් යුක්තය. ඒ සඳහා පිළිතුරු ලබා දී ඇති ආකාරය මෙසේය.

- i -අපේක්ෂකයන් 84% ක් පිළිතුරු සපයා ඇත. මෙමගින් උපවාසය ආශ්‍රිත දැනුම සාර්ථක යැයි නිගමනය කළ හැකිය.
- ii - මෙම කොටසට පිළිතුරු ලියා ඇති අපේක්ෂක ප්‍රතිශතය 63% කි. මෙම ප්‍රශ්නය ද ඉතා සරල ප්‍රශ්නයකි. එබැවින් මේ සඳහා 63% යන්න ඉතා සාර්ථක තත්ත්වයක් යයි නිගමනය කළ නොහැකිය.
- iii- මෙම කොටසට සාර්ථකව පිළිතුරු ලබා ඇති අපේක්ෂකයන් 85% කි. මෙය ද සරල ප්‍රශ්නයක් බැවින් මෙම ප්‍රතිශතය සාධාරණ යයි නිගමනය කළ හැකිය.
- iv- මෙම කොටස සඳහා 55% ක් නිවැරදි පිළිතුරු සපයා ඇත. මෙමගින් දෛනික ජීවිතයේ සිරිත් විරිත් පිළිබඳ වැඩි අවබෝධයක් නොමැති බව නිගමනය කළ හැකිය.
- v - මෙම කොටස සඳහා 53% ක් නිවැරදි පිළිතුරු ලබා දී ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී මේ පිළිබඳ අවබෝධය වැඩි දියුණු කළ යුතු බව නිගමනය කළ හැකිය.
- vi- මෙම කොටසට නිවැරදි පිළිතුරු ලබා දී ඇත්තේ 43% කි. මෙම ප්‍රශ්නයට අදාල ඉස්ලාමීය උසූලුල් ෆික්හ් පිළිබඳ ඇඩි අවධානය යොමු කළ යුතුව ඇත.
- vii- නිවැරදි පිළිතුරු ලබා දීමේ ප්‍රතිශතය 33% ක් ලෙස ඉතා අඩු ප්‍රතිශතයක් වාර්තා වන්නේ මෙම ප්‍රශ්නයෙනි. මෙමගින් කියාස් පිළිබඳ මනා දැනුමක් තහවුරු වී නොමැති බව පැහැදිලි වේ.

- viii - මෙම කොටසට නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 71% කි. ඒ අනුව හදීස් යන පදයේ අර්ථය පිළිබඳ අපේක්ෂකයන් තුළ මනා අවබෝධයක් ඇති බව නිගමනය කළ හැකිය.
- ix- මෙහි නව වන ප්‍රශ්නය වන්නේ ඉස්ලාමීය කාන්තාවකගේ ''අව්රතය'' කුමක්ද? යන ප්‍රශ්නයයි. මෙය ද ඉතා සරල ප්‍රශ්නයකි. එහෙත් මේ සඳහා නිවැරදි පිළිතුරු ලබා දී ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 59% කි.
- x- මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 58%ක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

මෙම ප්‍රශ්නය සඳහා වූ ෙ කාටස් 10 අතරින් ප්‍රශ්න 8ක් සඳහා අපේක්ෂකයන් 50% ඉක්මවා නිවැරදි පිළිතුරු සපයා තිබුණි. 50% අඩු ප්‍රමාණයක් නිවැරදි පිළිතුරු සපයා තිබුනේ ඩස වන ප්‍රශ්නය වන ඉමාම් ෂාෆි (රහ්) තුමාගේ ග්‍රන්ථ දෙකක් නම් කරන්න යන්න ප්‍රශ්නය හා ඩසසස වන ප්‍රශ්නය වන කියාස් යන්නෙහි අර්ථය කුමක් ද? යන ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්න දෙක ෂරීආ හි මගපෙන්වීම හෙවත් උසූලුල් ෆික්හ් යන තේමාවට අයත් ය. එබැවින් අපේක්ෂකයින් තුළ මෙම තේමාව සඳහා වූ දැනුම ප්‍රමාණවත් නොවන බව නිගමනය කළ හැකිය.

## 2 ප්‍රශ්නය

**2. (i) අකීදව මුල් කරගෙන බිහි වූ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.**

**(ii) 'නිෆාක්' යන පදය විග්‍රහ කර කුහකයකුගේ ප්‍රධාන ගති ලක්ෂණ සඳහන් කරන්න.**

**(iii) නබි (සල්) තුමා විසින් මහා පාපයන් ලෙස අවවාද කරනු ලැබුයේ කුමන ක්‍රියාවන් ද?**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(2) (i)
- මුඃතසිලා - කවාරිජ්වරු
- ජබරියියා
- මුර්ජිආ - අහමදියාවරු (කාදියානිවරු)
- කදරියා
- බාතිච්වරු

ඉහත කරුණු දෙකක් ලියා ඇත්නම් ලකුණක් බැගින් ලබා දෙන්න.

(1 x 2 = 2 ලකුණු)

(ii)
- කථාකිරීමේ දී බොරු කියයි.
- පොරොන්දු කඩකරයි.
- විශ්වාසය කඩකරයි.

විස්තර සඳහා 01 ලකුණක් ද ගති ලක්‍ෂණ සඳහා ලකුණු 02 ක්ද ඇතුලත් මෙවැනි කරුණු ලියා ඇත්නම් ලකුණු 03ක් ලබා දෙන්න.

(iii)
- ආදේශ කිරීම.
- දෙමව්පියන්ට හිංසා කිරීම.
- ගණිකා වෘත්තිය.
- දරුවන් ඝාතනය කිරීම.
- මිනී මැරීම.
- සුරාව, සූදුව, පොදු දේපල නාස්තිය, ඕපදූප කතා කිරීම, විකට නම් කීම, කටකතා පැතිර වීම, මිනිසුන් අතර ආරවුල් ඇති කිරීම.

  මෙවැනි කරුණු 05ක් ලියා ඇත්නම් ලකුණු 05ක් ලබා දෙන්න.

(1 x 5 = 5) ලකුණු

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

අල් - ආකඉද් මගින් පෙන්නුම් කෙරෙන ඒකත්වය, වක්තෘත්වය හා අවසන් දිනය යන තේමාව යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර ඇත. මෙම අකීදා යනු කුමක් ද? යන මූලික අවබෝධය ප්‍රධාන වශයෙන් අපේක්ෂා කෙරේ. ඉන් පසු ඒ මගින්,

- අකීදාව මුල්කරගෙන බිහිවූ ප්‍රධාන කොටස් දෙක ද,
- නිෆාක් යන පද විග්‍රහය හා කුහකයකුගේ ප්‍රධාන ගතිලක්ෂණ ද,
- නබි (සල්) තුමා විසින් මහා පාපයන් ලෙස අවවාද කරනු ලැබූ ක්‍රියාවන් ද

පිළිබඳ පුළුල් දැනුම අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය සාර්ථක වූවද, ලකුණු ගැනීමේ ප්‍රතිශත සතුටුදායක නොවේ. මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10 අතරින් ලකුණු 8-10 අතර ප්‍රමාණයක් ලබා ගෙන තිබුනේ 38% කි. ලකුණු 6-7 අතර ලකුණු ලැබූ පිරිස 23% කි. ලකුණු 3-5 අතර 29% ක් පමණ පිරිසක් සිටින අතරස 12% පමණ පිරිසක් සිටින්නේ ලකුණු 0 -2 අතර පරාසයෙන්ය.

මෙම ප්‍රශ්නයේ අනු කොටස් 3 සඳහා අපේක්ෂකයන් ලබාගෙන ඇති ලකුණු ප්‍රතිශතය මෙසේය, (4 ප්‍රස්තාරය ඇසුරෙන්)

I කොටස සඳහා - 69%

II කොටස සඳහා - 55%

III කොටස සඳහා - 66%

මෙහි දෙවන කොටසේ ප්‍රශ්නය නිෆාක් යන පදය විග්‍රහ කර කුහකයකුගේ ගති ලක්ෂණ සඳහන් කරන්න යනුවෙන් සඳහන් වූ ප්‍රශ්නය සඳහා පද විග්‍රහය නොකර ගති ලක්ෂණ පමණක් සඳහන් කිරීම ලකුණු අඩු වීමට හේතු විය.

## 3 ප්‍රශ්නය

3. (i) **සලාතයේ මහිමය කුමක් ද?**

(ii) **සකාත් ලැබීමට සුදුසු නොවන්නෝ කවරහු ද?**

(iii) **සුන්නත් උපවාසයේ යෙදිය හැකි දවස්වල ලැයිස්තුවක් සකස් කරන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i)
- සලාතය අනිවාර්ය කරන ලද වගකීමකි.
- මිනිසා පාප ක්‍රියාවලින් ආරක්ෂා කරයි.
- අල්ලාහ් සිය ගැත්තා සමග ඇති සම්බන්ධතාවය වැඩි දියුණු කරයි.
- මිනිසාගේ සිත කය දෙකෙහි පාරිශුද්ධතාවය ඇති කරයි.
- සලාතය කිනම් අවස්ථාවක වුව ද අතහැරීමට අවසර නැත. (සලාතය අතහැරීම මහා පාප කර්මකි.)
- අවසාන දිනයේ දී පළමුවෙන් විමසනු ලබන්නේ සලාතය ගැනයි.

(1/2 x 4 = 2 ලකුණු)

(ii)
- කාෆිර්වරු
- බනූ හාෂිම්, බනූ මුත්තලිබ් පවුකට අයත් වූවන්
- වහලුන්
- සකාත ලබා දෙන්නා යටතේ යැපෙන්නන්
- ධනවතුන්

(iii)

| සතිපතා | මාස්පතා | අවුරුදු පතා |
|---|---|---|
| • සඳුදා<br>• බ්‍රහස්පතින්දා | අයියාමුල් බීල්<br>13, 14, 15 (දුල් හජ් මාසය හැර)<br>අයියාමුස්සූද් (27, 28, 29, 30)<br>ෂඃබාන් මාසයේ වැඩි දින ගණනක් | මුහර්රම් 9, 10<br>දුල් හජ් 1 සිට 8 දක්වා<br>අරෆා දිනය<br>රමළාන් උත්සව දිනයට (ඊදුල් ෆිත්ර්) පසුව එන දින 6 |

(2 + 3 = 5 ලකුණු)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙය ''අල් ඉබාදත් හෙවත් ජීවිතය නැමදුමකි යන දෘෂ්ටි කෝණය වටහාගෙන කටයුතු කරන අතර මූලික නැමදුම් ඉටුකරයි'' යන තේමාව යටතේ පිළිතුරු සැපයීම අපේක්ෂා කර ඇත. මෙමගින්,

I සලාතයේ මහිමය

II සකාත් ලැබීමට සුදුසු නොවන්නන්

III සුන්නත් උපවාසයේ යෙදිය හැකි දින ලැයිස්තුගත කිරීම

ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කර ඇත. පරීක්ෂණය සඳහා පෙනී සිටි සමස්ත අපේක්ෂකයන්ගෙන් 77% පමණ මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත. (2 ප්‍රස්තාරයට අනුව) මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන ලද සමස්ත අපේක්ෂකයන් අතුරින්, ලකුණු 8-10 අතර ලකුණු ලබා ඇත්තේ 25% ක් පමණ පිරිසක් පමණි. 6-7 අතර ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් ප්‍රමාණය 22% කි. ලකුණු 3-5 අතර ලබා ගෙන තිබුනේ 38% කි. එසේම ලකුණු 0-2 අතර 16% ක් පමණ පිරිසක් සිටිති. බහුතර අපේක්ෂක සංඛ්‍යාවක් ලකුණු ලබා ඇත්තේ ලකුණු 3-5 අතරය. (3 වන ප්‍රස්තාරයට අනුව) මෙම ප්‍රශ්ණය සඳහා පිළිතුරු සපයා ඇති සමස්ත ආකාරය මෙසේය. (4 ප්‍රස්තාරයට අනුව )

I කොටස සඳහා - 85%
II කොටස සඳහා - 54%
III කොටස සඳහා - 47%

මෙමගින් සලාතයේ මහිමය පිළිබඳ ඉතා පුළුල් දැනුමක් ද, සකාත් ලැබීමට සුදුසු නොවන්නන් පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද අපේක්ෂකයන් තුල ඇති බව නිරීක්ෂණය විය. සුන්නත් උපවාසය පිළිබඳ අසා තිබූ ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇති සංඛ්‍යාව 47% වේ. **එහෙත් අපේක්ෂකයන් එය සතිපතා මාස්පතා හා අවුරුදු පතා යැයි තීරු 03 කට වෙන්කර ලැයිස්තුකරගත නොකිරීම ලකුණු අහිමි වීමට හේතු විය.** එබැවින්, ''ලැයිස්තුවක් සකස් කරන්න''. ආදී ප්‍රශ්නයක දී අදාළ තොරතුරු මූලික තේමා යටතේ ලැයිස්තුගත කිරීමට සිසුන්ට මග පෙන්වීම සඳහා ගුරුවරුන්ගේ අවධානය යොමු විය යුතුය.

## 4 ප්‍රශ්නය

4. **(i) දෙගුරුන් විසින් දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් කවරේ ද?**
**(ii) බිරිඳක විසින් තම සැමියාට ඉටු කළ යුතු වගකීම් කවරේ ද?**
**(iii) විවාහයක් වලංගු වීමට අවශ්‍ය කොන්දේසි මොනවා ද?**

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i)
- දරුවකු ඉපදී 7 වන දින අකීකා දීම
- හොඳ නමක් තැබීම
- යහපත් සිරිත් විරිත් කියා දීම
- ආහාර, ඇඳුම්, වාසස්ථාන ලබා දීම
- හොඳ අධ්‍යාපනයක් ලබා දීම

(ii)
- ස්වාමි පුරුෂයාට කීකරු ලෙස කටයුතු කිරීම
- ස්වාමි පුරුෂයා සතු වස්තූන් ආරක්ෂා කිරීම
- ස්වාමි පුරුෂයා අකමැති කිසිම පුද්ගලයෙකුව නිවසට ගෙන්වා නොගැනීම
- ඉස්ලාමීය ෂරීආවන්ට පටහැනි නොවන කරුණුවලදී ස්වාමි පුරුෂයාගේ ඉල්ලීමට එකඟව කටයුතු කිරීම
- ස්වාමි පුරුෂයාගේ දුකේදීත් සැපේදීත් ඔහුගේ සිත නොරිදවා කටයුතු කිරීම.
- ස්වාමි පුරුෂයාගේ අවශ්‍යතාවයන් දැන හැඳින ගෙන කටයුතු කිරීම
- ස්වාමි පුරුෂයාගේ ආදරය හා කරුණාව ලබා ගැනීමට කටයුතු කිරීම
- ස්වාමි පුරුෂයා සතු රහස්‍යභාවය ආරක්ෂා කිරීම
- ස්වාමි පුරුෂයා තම අවශ්‍යතාවයන් සඳහා කතා කළ විට එයට එකඟ වීම

(1/2 x 4 = 2 ලකුණු)

(iii)
- මනාලිය - මනමාලයා
- ඊජාබ් - කබූල්
- වලී
- සාක්ෂිකරුවන් දෙදෙනෙක්
- මහර් ප්‍රදානය කිරීම (1 x 5 = 5 ලකුණු)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙම ප්‍රශ්නය ෆික්හුල් උස්රා හෙවත් ඉස්ලාමීය පවුල් ජීවිතය පිළිබඳ මග පෙන්වීම යන තේමාවන් පිළිතුරු ලිවීම අපේක්ෂා කර ඇත. මෙමගින්

- දෙගුරුන් විසින් දරුවන් වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම්
- බිරිඳක විසින් තම සැමියාට ඉටුකළ යුතු වගකීම්
- විවාහයක් වලංගු වීමට අවශ්‍ය කොන්දේසි

යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. සමස්ථ අපේක්ෂකයන් අතරින් විශාල පිරිසක් තෝරාගෙන ඇත්තේ මෙම ප්‍රශ්නයයි. පළමුවන අනිවාර්ය ප්‍රශ්නයෙන් පසු අපේක්ෂකයන්ගේ තේරීම් අතරින් දෙවන ස්ථානය හිමිවන්නේ මෙම ප්‍රශ්නය සඳහාය. මෙහි තෝරා ගැනීමේ ප්‍රතිශතය 88% කි. (2 ප්‍රස්තාරය ඇසුරින්.)

මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 10 අතරින් ලකුණු 8-10 අතර ප්‍රමාණය හිමිකර ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 51% කි. මෙය අන් කිසිදු ප්‍රශ්නයකට හිමි නොවූ අවස්ථාවකි. එසේම මෙහි 6-7 අතර ප්‍රාමණය ලබා ගෙන තිබුනේ 15% කි. ලකුණු 3-5 අතර ප්‍රාමණය ලබා ගෙන තිබුනේ 28% කි. එසේම ලකුණු 0-2 අතර ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ 7% ක් පමණ ප්‍රමාණයකි. මෙය ද අන්කිසිදු ප්‍රශ්නයකට හිමි නොවූ අවස්ථාවකි. එබැවින් අන් සියළු ප්‍රශ්න අභිබවා මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම ඉතා සාර්ථක යැයි නිගමනය කළ හැකිය. (3 ප්‍රස්තාරය ඇසුරින්)

මෙම ප්‍රශ්නයේ අනු කොටස් සඳහා ලකුණු හිමිකරගෙන ඇති ආකාරය මෙසේ ය. (4 ප්‍රස්ථාරය ඇසුරින්.)

I කොටස සඳහා - 92%
II කොටස සඳහා - 88%
III කොටස සඳහා - 67%

මේ අනුව සමස්ථයක් ලෙස ඉස්ලාමීය පවුල් ජීවිතය පිළිබඳ දැනුම සාර්ථක යැයි නිගමනය

## 5 ප්‍රශ්නය

5. **(i) 'හජ්' වගකීම ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවා ද?**
**(ii) නබි (සල්) තුමා අරෆාවේ කළ ඓතිහාසික දේශනයේ ඇතුළත් වූ ප්‍රධාන කරුණු මොනවා ද?**
**(iii) 'හුදෙබියා' ගිවිසුමට ඇතුළත් වූ ප්‍රධාන කරුණු සඳහන් කරන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i)
- අල්ලාහ්ගේ අණට කීකරු වීමම
- සිත, කය, වස්තුව මගින් තම විශ්වාසභාවය පෙන්නුම් කිරීම
- සහෝදරත්වය මුළු ලෝකයේම තහවුරු කිරීම
- දුගී බව සහ පව් තුරන් කරයි.
- පරිත්‍යාගය ඉවසීම යන ගුණාංග වැඩි දියුණු වේ.
- සමාජයේ ජාති භේද, කුල භේද, වර්ණ භේද තුරන් වේ.
- අනුන්ට හිංසා කිරීමේ මනසක් ඇති නොවේ.
- හජ් ඉටු කිරීමෙන් එදින ඉපදුනු ළදරුවෙකුගේ තත්ත්වයට පත් වෙයි.

(1/2 x 4 = 2 ලකුණු)

(ii) • ඔබලාගේ වස්තුව, ආත්මය හා ආත්ම ගෞරවය උතුම් කොට සලකන්න.
- තම තමන් කළ වැරදි තම තමන්ම භාර ගත යුතුයි.
- අද සිට පොළිය තහනම් කොට ඇත.
- ජාහිලියා යුගයේ පැවති පළිගැනීමේ චේතනාව අත හරින්න.
- ස්ත්‍රීන් සම්බන්ධව අල්ලාහ්ට බිය වන්න. ඔවුන් සම්බන්ධව සාධාරණය ඉෂ්ඨ කරන්න.
- ඔබලා වෙත කරුණු දෙකක් තබා යන්නෙමි. එය පිළිපදින තාක් ඔබලා නොමග නොයනු ඇත. ඒවා නම් අල් කුර්ආනය සහ මාගේ ජීවන මාර්ගයයි. (සුන්නාහ්)
- මා විසින් පවසන ලද කරුණු අන් අයට ද පවසන්න.

(1 x 3 = 3 ලකුණු)

(iii) • දෙපාර්ශවයම අවුරුදු 10 කට සටන් නොවැදීම
- බියෙන් තොරව දෙපාර්ශවයම ජීවත් වීම.
- මුස්ලිම්වරුන් එම වර්ෂයේ දී මක්කාවට නොපිවිසිය යුතුයි.
  මීළඟ අවුරුද්ද මක්කාවට පැමිණෙන විට නිරායුධව දින තුනක් රැඳී සිටිය හැකිය. එම තෙදිනම කුරෙයිෂ්වරු මක්කාවෙන් පිටත සිටිති.
- කුරෙයිෂ්වරුන් කිසිවෙකු අවසර නොමැතිව මක්කාවට පැමිණියහොත් ඔහු ආපසු එවිය යුතුය. නමුත් මුස්ලිම්වරුන්ගෙන් කිසිවෙකු කුරෙයිෂ්වරුන් වෙත පැමිණියහොත් ඔවුන් නැවත එවනු නොලැබේ.
- දෙපාර්ශවයම තම තමන්ට අයත් වෙනත් ගෝත්‍ර සමඟ තම ගිවිසුම් ඇතිකරගත හැකිය. එහෙත් කුරෙයිෂ්වරුන්ගේ මිතුරු පාර්ශවයට මුස්ලිම්වරුන් විරුද්ධ විය නොහැකිය. එසේම මුස්ලිම්වරුන්ගේ මිතුරු පාර්ශවය කුරෙයිෂ්වරුන් විසින් පහර දීමට ලක් නොකළ යුතුය.
- හුදෙයිබියා ගිවිසුම හිජ්රි 6 දී සිදුවිය.

(1 x 5 = 5 ලකුණු)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙය අල් ඉබාදත් හෙවත් ජීවිතය නැමදුමකි යන තේමාව කෙරෙහි අවධානය යොමු කළ ප්‍රශ්නයකි. මෙමගින්,

- හජ් වගකීම ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ
- නබි (සල්) තුමා අරෆාවේ කළ ඓතිහාසික දේශනයේ ඇතුළත් ප්‍රධාන කරුණු
- හුදෙයිබියා ගිවිසුමට ඇතළත් වූ ප්‍රධාන කරුණු ආදිය කෙරෙහි අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරිණි.

සමස්ථ අපේක්ෂකයන්ගෙන් ඉතා අඩු සංඛ්‍යාවක් තෝරා ගෙන ඇත්තේ මෙම ප්‍රශ්නයයි. මෙය තෝරාගැනීමේ ප්‍රතිශතය 42% කි. (2 ප්‍රස්ථාරය ඇසුරිනි)
මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10 අතුරින් ලකුණු 8-10 අතර ලබා ගෙන තිබුනේ 42% කි. ලකුණු 6-7 අතර 12% ක් පමණ පිරිසක් සිටී. ලකුණු 3-5 අතර ලබා ගෙන තිබූ ප්‍රතිශතය 27% ක් වූ අතර, ලකුණු 0-2 අතර 18% ක පිරිසක් සිටිති.

මෙම ප්‍රශ්නයේ කොටස් තුන සඳහා පහත ආකාරයට නිවැරදි පිළිතුරු සපයා තිබුණි. (4 ප්‍රස්තාරය)

I කොටස සඳහා - 92%
II කොටස සඳහා - 67%
III කොටස සඳහා - 62%

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නයේ කොටස් 3 සඳහා නිවැරදි පිළිතුරු සැපයූ ප්‍රතිශතය 60 ඉක්මවා ගොස් ඇත. මෙහි 1 කොටස වන හජ් වගකීම ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවාද යන ප්‍රශ්නය සඳහා ඉතා සාර්ථකට පිළිතුරු සපයා ඇත. එසේම අරෆා දේශනයේ ඇතුලත් වූ ප්‍රධාන කරුණු හා හුදෙයිබියා ගිවිසුමට ඇතුලත් ප්‍රධාන කරුණු කෙරෙහි අපේක්ෂකයන්ගේ දැනුම සාර්ථක යයි නිගමනය කළ හැකිය.

6 ප්‍රශ්නය

6. (i) **ඉස්ලාම් ඉපැයීමට දී ඇති ප්‍රධානත්වය විදහාපාන කරුණු දෙකක් සඳහන් කරන්න.**

(ii) **පොලිය හා වෙළෙඳම අතර ඇති වෙනස ලැයිස්තුගත කරන්න.**

(iii) **වෙළෙඳ ගනුදෙනුවල දී වැළකිය යුතු කරුණු කවරේ ද?**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i)
- අල්ලාහ් තආලා මෙම මිහිතලය මවා විහිදා පැතිරෙව්වේය. එහි නන් දෙසට ගොස් ඔබට පුදකල ආයාදයන් භුක්ති විඳින්න.
- යම් කෙනෙකු තම දැතින් උපයා සකසා ගන්නා ආහාරය වෙන කිසිම ආහාරයකට දෙවෙනි වන්නේ නැත. (බුහාරි)
- අල් කුර්ආනය ජිහාද් සහ ඉපයීම යන දෙක එකට සම්බන්ධකොට පෙන්වන්නේය.
- තම ජීවිකාව සඳහා නබිවරුන් සියලු දෙනාම උපයා ජීවත් වූහ.
- නබි (සල්) තුමාණන් කුඩා වියේ පටන්ම අනුන්ට බරක් නොවී එළුවන් බලා ගැනීම, වෙළඳාම් කිරීම යන ඊකියාවන්වල නියැලුණහ.
- හිජ්රත් ගිය සහාබවරු මදීනා වාසින් දෙනු ලැබූ තෑගිබෝග ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සඳහා වෙළඳ පොල පෙන්වා දෙන ලෙස ඉල්ලා සිටියහ.

අවස්ථා සඳහන් කිරීමේදී
- නබි (සල්) තුමාණන් විසින් දෑත්වල කරගැට මතු වී තිබුණු කම්කරුවෙකුගේ දෑත් සිප ගැනීම.
- සිඟමන් ඉල්ලා පැමිණි මිසිසෙකුට පොරොවක් මිලදී ලබාගෙන ඉපයීමට දිරි ගැන්වීම.

(1 x 2 = 2 ලකුණු)

(ii)
- වෙළඳාම අල්ලාහ් අපට හලාල් කොට ඇත. පොළිය හරාම් කොට ඇත.
- පොළිය ලාභය පමණක් අපේක්ෂා කරන අතර වෙළඳාම ලාභය හා පාඩුව යන දෙකම ලබා දෙන්නෙකි.
- පොළිය මගින් ලාභය නැවත නැවත ලැබෙන අතර වෙළඳාම මගින් එක් වරක් පමණක් ලාබය හිමි වේ.
- පොළිය අල්ලාහ් විසින් විනාශ කරනු ලබයි. වෙළඳාම අල්ලාහ් වර්ධනය කරයි.
- පොළිය විනාශය හා නාස්තිය ඇති කරයි. වෙළඳාම සෞභාග්‍යය හා සම්පත වැඩි දියුණු කරයි.
- පොළිය හා සම්බන්ධ පුද්ගලයින්ව මිනිසුන් පිළිකුල් කරන අතර වෙළඳාම් කරන්නාට කරුණාව දක්වති.

(1 x 3 = 3 ලකුණු)

(iii)
- බොරුවට දිවීම
- කිරුම් මිණුම්වල වංචාව
- සඟවා තැබීම
- මිළ ප්‍රමාණයට වඩා අධික වීම
- බාල ද්‍රව්‍ය මිශ්‍ර කිරීම
- බොරු කීම
- සොරකම් කරන ලද භාණ්ඩ
- බලෙන් ලබා ගන්නා ලද භාණ්ඩ
- නිශ්ඵල භාණ්ඩ විකිණීම. (1 x 5 = 5 ලකුණු)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙම ප්‍රශ්නය ෆික්හුල් මාලියියාත් හෙවත් ඉපයීම් ද ආදායම් ලැබීමේ දී ද හලාල් හරාම් සුරැකීම යන තේමාව කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරුණි.
මෙම ප්‍රශ්නය මගින්,

I ඉස්ලාම් ඉපැයීමට දී ඇති ප්‍රධානත්වය විදහාපාන කරුණු දෙකක් ද,
II පොලිය හා වෙළෙඳාම අතර ඇති වෙනස ලැයිස්තුගත කිරීම ද,
III වෙළෙඳ ගනුදෙනුවල දී වැළකිය යුතු කරුණු කෙරෙහි පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරිණි.

සමස්ත අපේක්ෂකයන්ගෙන් 55%ක් මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇත. (2 ප්‍රස්තාරය ඇසුරින්)

මෙම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 10න් 40%ක් එනම් ලකුණු 8-10 අතර ප්‍රමාණයක් ද, 20% ක් එනම් ලකුණු 6-7 අතර ප්‍රමාණයක් ද 20%ක් එනම් ලකුණු 6-7 අතර ප්‍රමාණයක් ද ලබා ගෙන ඇත. එසේම 0-2 අතර ප්‍රමාණයේ ලකුණු ලබා ගෙන ඇත්තේ 12%කි. (3 ප්‍රස්තාරය ඇසුරින්)

මෙම ප්‍රශ්නයේ අනු කොටස් 3 සඳහා නිවැරදි පිළිතුරු ලියා ඇති ප්‍රතිශතය මෙසේය.
I කොටස සඳහා - 63%
II කොටස සඳහා - 70%
III කොටස සඳහා - 69%

සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති ෆිල්හුක් මාලියියාත් කෙරෙහි වූ දැනුම සාර්ථක යයි නිගමනය කළ හැකිය.

7 ප්‍රශ්නය

7. (i) **මුස්ලිම් පිරිමියකුගේ ඇඳුම පිළිබඳව අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද?**
(ii) **මුස්ලිම්වරයෙකු 'හලාල් ආහාර පමණක් අනුභව කළ යුත්තේ මන්ද'යි පැහැදිලි කරන්න.**
(iii) **මුස්ලිම් කෙනෙකු විවාහ වීමට තහනම් කර ඇති 'මහ්රම්'වරුන් කවරේ ද'යි ලැයිස්තුගත කරන්න.**

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i)
- පෙකණියේ සිට දණහිස දක්වා වූ පෙදෙස පිරිමියෙකුගේ අව්රතය වේ.
- සේද ඇඳුම් ඇඳීමේන වැළකී සිටිය යුතුය.
- වළලු කරට පහතින් නොවැසෙන පරිදි ඇඳිය යුතුය.
- ස්ත්‍රීන්ගේ ඇඳුම් පිරිමින් නොඇඳිය යුතුයි.
- පිරිසිදු මූලද්‍රව්‍යයන්ගෙන් වියන ලද ඒවා විය යුතුයි.
- චාම් ඇඳුමක් විය යුතුයි.
- ශරීරයට හිරවෙන පරිදි සහ විනිවිද පෙනෙන පරිදි නොඇඳිය යුතුයි.
- කුංකුම වර්ණ ඇඳුම් භාවිතය

(1/2 x 4 = 2 ලකුණු)

(ii)
- අල්ලාහ් හා ඔහුගේ දූතයාගේ අණට කීකරු වීම
- හලාල් වූ ආහාර අනුභව කිරීමෙන් ප්‍රාර්ථනාවන් ඉෂ්ඨ වේ.
- හලාල් වූ ආහාර අනුභව කිරීමෙන් තම ශරීරය ස්වර්ගයට පිවිසේ
- දාන, පරිත්‍යාග පිළිගැනේ.
- සිත සහ කය ආලෝකමත් වේ. (1 x 3 = 3 ලකුණු)

(ii)

| ස්ථිර මහ්රම් | තාවකාලික මහ්රම් |
|---|---|
| • ලේ නෑයෝ - උදා : මව, දුව, සහෝදරිය<br>• විවාහ බන්ධනයෙන් (උදා) : නැන්දා, භාර්යාවගේ දුව<br>• කිරි බීමෙන්, භාර්යාවගේ පෙර ස්වාමි පුරුෂයාගේ දුව | • භාර්යාවගේ එක්කුස උපන් සහෝදරිය<br>• භාර්යාවගේ මව |

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන :**

මෙය ෆික්හුල් උස්රා හෙවත් ඉස්ලාමීය පවුල් ජීවිතය පිළිබඳ මග පෙන්වීම් යන තේමාව යටතේ පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ

- මුස්ලිම් පිරිමියෙකුගේ ඇඳුම් පිළිබඳ අවධානය යොමු කළ යුතු කරුණු
- මුස්ලිම් පිරිමියෙකු හලාල් ආහාර පමණක් අනුබව කළ යුත්තේ මන්ද
- මුස්ලිම් කෙනෙකු විවාහ වීමට තහනම් කර ඇත්තේ මහ්රම්වරුන් කවරේ ඇයි ලැයිස්තු ගත කිරීම යන කොටස් කෙරෙහි පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

සමස්ත අපේක්ෂකයන්ගෙන් මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ 70% ක ප්‍රතිශතයකි.

මෙහි මුළු ලකුණු 10 න් 8-10 අතර ලබා ගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 33% කි. ලකුණු 6-7 අතර 22%ක් ද, ලකුණු 3-5 අතර ප්‍රමාණය 32% ක් ද, ලකුණු 0-2 අතර ප්‍රමාණය 14% ක් ද, ලකුණු ලබාගෙන ඇත. (3 ප්‍රස්තාරය ඇසුරින්)

| | | | |
|---|---|---|---|
| I | කොටස සඳහා | - | 86% |
| II | කොටස සඳහා | - | 62% |
| III | කොටස සඳහා | - | 54% |

මෙහි I කොටස වන මුස්ලිම් පිරිමියෙකුගේ ඇඳුම පිළිබඳව අවධානය යොමු කළ යුතු කරුණු කෙරෙහි වූ අපේක්ෂකයන්ගේ පිළිතුරු ඉතා සාර්ථක යයි නිගමනය කළ හැකිය. II කොටස වන මුස්ලිම්වරයෙකු හලාල් ආහාර පමණක් අනුභව කළ යුත්තේ මන්දැයි පැහැදිලි කරන්න. යන ප්‍රශ්නය සඳහා වු පිළිතුරු සතුටුදායක වුව ද, ඒ සඳහා අයදුම්කරුවන්ගෙන් ද 38% ක ප්‍රමාණයක් ලකුණු හිමි කරගෙන නොමැත. ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර නොග ැනීම මෙයට හේතුවී ඇත. හලාල් ආහාර අනුභව කළ යුත්තේ මන්ද? යන ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු වූයේ අල්ලාහ්ගේ අණට කීකරු වීම, ප්‍රාර්ථනාවන් ඉෂ්ඨවීම, ශරීරය ස්වර්ග යට පිවිසීම, පරිත්‍යාග පිළිගැනීම, සිත සහ කය ආලෝකමත් වීම ආදී පිළිතුරුය. එහෙත් ලකුණු අහිමි වූ අපේක්ෂකයන්ගේ පිළිතුරු වූයේ හලාල් හා හරාම් වූ ආහාර නම් කිරීමය.

මෙහි වන කොටස මුස්ලිම් කෙනෙකු විවාහ වීම තහනම් කර ඇති මහ්රම්වරුන් කවරේ ඇයි ලැයිස්තුවක් හෝ වගුවක් නොමැතිව නම් කර තිබුණි. ඒ අනුව ස්ථිර මහ්රම් හා තාවකාලික මහර්ම් හා තාවකාලික මහ්රම් යයි තීර දෙකක් යටතේ සඳහන් කිරීම අපේක්ෂිත පිළිතුර අතර විය. මෙය නොලිවීම උපරිම ලකුණු නොලැබීමට හේතු විය.

# III කොටස

## 3.0 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු :-

**පොදු උපදෙස් :**

- ⋆ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරුසැපයිය යුතු ද? කුමන ප්‍රශ්න අනිවාර්යය ද? කොපමණ කාලයක් ලැබේ ද? කොපමණ ලකුණු ලැබේ ද? යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
- ⋆ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.
- ⋆ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ⋆ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ⋆ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ⋆ ප්‍රශ්න අංක හා අනු කොටස් නිවැරදිව ලිවිය යුතුය.
- ⋆ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ⋆ ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ උපදෙස්**

- ✶ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ඉස්ලාමීය ජීවිතයේ ප්‍රායෝගික කරුණු හා සම්බන්ධකරමින් පිළිතුරු සැපයීම යහපත් ය.
- ✶ ඉස්ලාමීය විෂය හා සම්බන්ධ අරාබි වචන සඳහන් ව ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී එම වචන මනාව අවබෝධ කරගෙන පසුව පිළිතුරු සැපයීම ආරම්භ කළ යුතුය.

3.2. **ඉගෙනුම් හා ඉගෙන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා :-**

| |
|---|
| ✶ ඉස්ලාමිය භාවිතයේ ඇති වචන හා අරාබි වචන නිසි ලෙස හඳුනාගත හැකි වන ලෙස ඉගැන්වීම් සිදුවිය යුතුය<br><br>✶ ඉස්ලාම් විෂය සඳහා පමණක් නොව ප්‍රායෝගික ජීවිතය සමග ද සමීප වන බැවින් ඒ කෙරෙහි සිසුන්ගේ අවධානය යොමුවන ආකාරයට, ප්‍රායෝගිකව ඉගැන්වීමෙන් සිසුන්ගේ සිත දිනාගත හැකිය. |